## පොලිස් ත්‍යාග අරමුදල- 2012

### 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2012 දෙසැම්බර් 31 දිනට පොලිස් ත්‍යාග අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.2.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති

පොලිස් ත්‍යාග අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා මුදල් පදනම සහ උපචිත පදනම යන ක්‍රම 2 ම භාවිතා කර තිබූ අතර ඒ බව ගිණුම්කරණ ප්‍රතිපත්ති යටතේ හෙළිදරව් කර නොතිබුණි.

#### 1.2.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය තුළ දී උසාවි දඩ මුදල් වශයෙන් ලැබූ රු.184,166 ක මුදලක් ගිණුම්වලින් අත්හැරි තිබුණු අතර උසාවි දඩමුදල් වශයෙන් ලද එකතුව රු.512,997 ක් වූ චෙක්පත් දෙකක් අගරු වී තිබුණ ද, එම අගරුවීම ද ගිණුම්ගත කර නොතිබුණි.

(ආ) පොලිස් මත්ද්‍රව්‍ය කාර්යාංශය සඳහා ලබා දී තිබූ රු.2,500,000 ක ප්‍රදර්ශන මුදල් අත්තිකාරම්වලින් රු.1,880,000 ක මුදලක් 2012 දෙසැම්බර් 28 දින නිරවුල් කර තිබුණත්, එම සම්පූර්ණ මුදලම අත්තිකාරම් ලෙස මූල්‍ය ප්‍රකාශනයේ දක්වා තිබුණි.

#### 1.2.3 නොසැසඳු පාලන ගිණුම්

සමාලෝචිත වර්ෂය තුළ දී ත්‍යාග ගෙවීම් සම්බන්ධ මූල්‍ය ප්‍රකාශනයේ දැක්වෙන වියදම් සහ පොලිස් මුලස්ථානයේ අපරාධ කොට්ඨාශ මගින් ඉදිරිපත් කළ වාර්තාවල දැක්වෙන වියදම් අතර රු.34,972,547 වෙනසක් නිරීක්ෂණය විය. විස්තර පහත දැක්වේ.

| ගිණුම් විෂයය | මූල්‍ය ප්‍රකාශන අනුව වියදම | අපරාධ කොට්ඨාශයේ වාර්තා අනුව වියදම | වෙනස |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| සාමාන්‍ය හා විශේෂ අග්‍රිම යටතේ ත්‍යාග ගෙවීම් | 585,251,602 | 553,382,055 | 31,869,547 |
| විශේෂ ත්‍යාග සඳහා ගෙවීම් | 33,091,500 | 29,988,500 | 3,103,000 |
| | 618 343 102 | 583,370,555 | 34,972,547 |

1.2.4 **අවිනිශ්චිත ගිණුම**

2003 වර්ෂයේ සිට පැවතෙන රු.48,929 ක අවිනිශ්චිත ගිණුමේ බැර ශේෂය හඳුනාගෙන නිවැරදි කිරීමට පියවර ගෙන නොතිබුණි.

1.2.5 **ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) පොලිස් අනුග්‍රහ අරමුදලට ලබා දී තිබුණු රු.2,000,000 ක් වූ අත්තිකාරම් මුදල් සඳහා වර්ෂ 13 ක පමණ කාලයක් ගත වී තිබුණ ද, එම මුදල නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) කාර්යයන් 02 ක් සඳහා ලැබුණු මුදලින් ඉතිරි වූ රු.660,997 ක් වර්ෂ 07 කට වැඩි කාලයක් තිස්සේ නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) සුනාමි ආධාර වංචා කිරීම සම්බන්ධයෙන් අරමුදල විසින් උසාවියේ තැන්පත් කර තිබුණු රු.64,800 ක මුදල අයකර ගත නොහැකි ශේෂයක් ලෙස සලකා සමුච්චිත අරමුදලට ලියාහැර තිබුණි.

1.2.6 **විගණන සාක්ෂි නොවීම**

2012 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු විශේෂ ත්‍යාග වටිනාකම රු.65,304,411 ක් වූ අතර ඒ සම්බන්ධ උපලේඛනයක් හා කාල විශ්ලේෂණයක් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

1.2.7 **නීති, රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම.**

2006 දෙසැම්බර් 22 දිනැති අංක පීඑෆ්/423 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාර 2012 වර්ෂය සඳහා අයවැය ලේඛනයක් සකස්කර නොතිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂය තුළ දී අරමුදලේ කටයුතුවල මෙහෙයුම් ප්‍රතිඵලය රු.369,271,321 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.248,926,156 ක් විය. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.120,345,165 ක වර්ධනය කෙරෙහි උසාවි දඩ මුදල් හා වෙනත් ලැබීම් හා ආයෝජන ආදායම් පිළිවෙලින් රු.92,921,561 ක් හා රු.79,164,379 කින් වැඩිවීම විශේෂයෙන් බලපා තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

රු.මිලියන90 කට ආසන්න මුදලක් වර්ෂය පුරා නිශ්කාර්යීව බැංකු ජංගම ගිණුමක රඳවාගෙන තිබුණු අතර අවශ්‍යතාවය නිවැරදිව පුරෝකථනය කරන ලද්දේ නම් අතිරික්ත මුදල් ස්ථාවර තැන්පතුවක ආයෝජනය කර රු.මිලියන11.2 ක පොලී ආදායමක් ලබාගැනීමට හැකියාව තිබුණු බව නිරීක්ෂණය විය.

### 3.2 කාර්ය සාධනය

#### 3.2.1 ත්‍යාග සඳහා ගෙවීම්

සමාලෝචිත වර්ෂය තුළ දී විවිධ අවස්ථාවන් යටතේ පොලිස් ත්‍යාග අරමුදලින් ප්‍රධාන පරීක්ෂක තත්ත්වයේ සහ ඊට පහළ පොලිස් නිලධාරින් 396287 දෙනෙකුට සාමාන්‍ය හා විශේෂ අග්‍රිම යටතේ රු.මිලියන553.4 ක් ත්‍යාග සඳහා ගෙවීම් කර තිබුණු අතර ඉකුත් වර්ෂයේ දී ඒ වෙනුවෙන් නිලධාරින් 81276 ක් සඳහා රු.මිලියන373.4 ක් වැයකර තිබුණි. තවද සමාලෝචිත වර්ෂය තුළ දී පොලිස්පතිතුමාගේ නිර්දේශය මත අපරාධ අනාවරණය කරගැනීම වෙනුවෙන් නිලධාරින් 1160 ක් හා සිවිල් පුද්ගලයින් 72 ක් සඳහා රු.මිලියන29.9 ක් විශේෂ ත්‍යාග සඳහා ගෙවීම් කර තිබුණු අතර ඉකුත් වර්ෂයේ දී ඒ වෙනුවෙන් නිලධාරින් 762 දෙනෙකුට රු.මිලියන17.5 ක් ගෙවා තිබුණි.

## 4. පද්ධති හා පාලනය

විගණනයේ දී නිරීක්ෂණය වූ පද්ධති හා පාලනයේ අඩුපාඩු පිළිබඳ වරින් වර පොලිස්පතිතුමා වෙත යොමුකරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි ද විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) ත්‍යාග ගෙවීම් පාලනය